# මහකොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතිය)- 2010

## 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2010 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දක්වන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූලවී තිබුණු බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශ

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශ හා සපයා තිබෙන තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රුපියල් මිලියන 5,636.79 ක් වූ අතර 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රුපියල් මිලියන 7,878.91ක් විය. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 2010 | 2009 | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) |
| ස්ථාවර වත්කම් | 77.52 | 0.56 | 193.97 |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | 805.85 | 391.19 | 2,485.85 |
| කෙරගෙන යන වැඩ | 80.05 | 44.83 | 350.35 |
| උපදේශක සේවා | 4,601.58 | 160.33 | 4,761.92 |
| පොලි සහ සේවා ගාස්තු | 71.79 | 13.87 | 86.82 |
| | 5,636.79 | 610.78 | 7,878.91 |

## 3. විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත ව්‍යාපෘති කාල සීමාව තුළ කාර්යක්ෂමව හා සකසුරුවම් ලෙස ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘතිය විසින් සමස්ත ව්‍යාපෘති කාලසීමාව ආවරණය කිරීමට සඳහා පරිපූර්ණ ව්‍යාපෘති සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙළ කර එය කාලීනව නියාමනය කළ යුතුය. සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් හා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් කාලීනව ඇගයීම් සිදු කළ බව තහවුරු කිරීමට සාක්ෂි ලැබී නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීම හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන වශයෙන් වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතියේ කටයුතු පූර්ණ වශයෙන් පරීක්ෂා කිරීමට අභ්‍යන්තර විගණන නිලධාරීන් යෙදවිය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා වලින් අනාවරණය වී තිබුණේ එකී කටයුතු ගෙවීම් තහවුරු කිරීමට හා ලේඛන නඩත්තු කිරීම් පරීක්ෂා කිරීමට පමණක් සීමා වී තිබුණු බවය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ පරිපාලන කටයුතු පරිපාලන සහ මාර්ග ඉදිකිරීම්වල භෞතික නිරීක්ෂණ ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් සිදු කරන ලද කොන්ත්‍රාත් පරිපාලන කටයුතු සහ වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීම වැනි කටයුතු අභ්‍යන්තර විගණන නිලධාරීන් විසින් සිදුකර නොතිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලය තනතුරු 56 ක් පමණක් අනුමත කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති කාර්යාලයේ සේවක සංඛ්‍යාව සාමාජිකයින් 76 ක ගෙන් සමන්විත විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රධාන ඉංජිනේරු (ප්‍රසම්පාදන) ප්‍රධාන ඉංජිනේරු (තාක්ෂණ සහයක) ව්‍යාපෘති ලේකම්, ව්‍යාපෘති ඉංජිනේරු වැනි ප්‍රධාන තනතුරු ඇතුලත්ව අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 24 ක් පුරප්පාඩුව පැවතුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණු තනතුරු සඳහා ලිපිකරුවන් 16 දෙනෙක්ද ඇතුලත්ව සේවකයින් 43 ක් ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා තිබුණි.

(ඈ) කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාණතා පත්‍ර වල සඳහන් වු අවශ්‍ය වාහන සංඛ්‍යාව අතුරින් ව්‍යාපෘතිය විසින් මිලදී ගත් වාහනයක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ 2010 අප්‍රියෙල් 20 දිනැති අංක 146(3) දරණ චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව නියෝජ්‍ය අමාත්‍යවරයා ගේ භාවිතය සඳහා වෙන් කර තිබුණි.

## 4. මූල්‍ය හා භෞතික කාර්යය සාධනය

-----------------------

### 4.1 අරමුදල් උපයෝජනය

---------------------------

මූල්‍ය ප්‍රකාශන හා සපයා තිබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තෙක් ව්‍යාපෘතියේ මූල්‍යනය, අය වැය ප්‍රතිපාදනය සහ අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කීපයක් පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| | | ණය ගිවිසුම අනුව සැපයීමට එකග වූ මුදල | 2010 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
| | ජපන් යෙන් මිලියන | රුමිලියන | රුමිලියන | % |
| ණය පී 89 | 21,917 | 24,547 | 8,737 | 35.6 |
| ණය පී 91 | 25,057 | 27,460 | 12 | 0.04 |
| ශ්‍රී ලංකා රජය | | 20,917 | 2,783 | 13.3 |
| | 46,974 | 72,924 | 11,532* | 15.8 |

*අත්තිකාරම් ඇතුලත් වීම හේතුවෙන් මෙම මුදල 2.1 ඡේදයේ දැක්වූ සංඛ්‍යාවෙන් වෙනස් වේ.

## 4.2 භෞතික කාර්යය සාධනය

### 4.2.1 මාර්ග ඉදිකිරීම් කටයුතු

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී වැඩ වල 18.14 % ක ප්‍රගතියක් අත්කර ගැනීමට බලාපොරොත්තු වුවද ප්‍රගති වාර්තා අනුව, කොට්ටාව සිට කඩුවෙල (අදියර 01) දක්වා වූ කි.මී.12 ක් සඳහා වූ මාර්ගය ඉදිකිරීම් වැඩ 15.3% ක ප්‍රගතියක් පෙන්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට කොට්ටාව ඒ 4 අන්තර් හුවමාරුවේ වැඩ වලින් 49.91% ක් සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු විය. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැඩ වලින් 37.71 % ක ප්‍රගතිය පමණක් පෙන්වා තිබුණි.

(ආ) කඩවෙල සිට කඩවත (02 අදියර) දක්වා මාර්ගය සහ කඩවත සිට කෙරවලපිටිය දක්වා මාර්ගය ඉදිකිරීම් සඳහා වූ කොන්ත්‍රාත්තු සමාලෝචිත වර්ෂය අවසානයේ වන තෙක් ප්‍රදානය කර නොතිබුණි.

### 4.2.2 ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අදියර තුනක් යටතේ ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගත් ඉඩම් පිළිබඳ ප්‍රගතිය පහත දැක්වේ.

| | 2010 දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | අත්පත් කරගත් මුළු ඉඩම් කොටස් ගණන | වන්දි ගෙවූ ඉඩම් කොටස් ගණන | වන්දි ගෙවීම් පිළිබඳ ප්‍රගතිය % | ගෙවූ වන්දි මුදල රු(මිලියන) |
| කොට්ටාව-කඩවත(අදියර 01) | 1,066 | 844 | 79 | 1,320.31 |
| කඩවෙල-කඩවත (අදියර 02) | 1,188 | 343 | 26 | 908.46 |
| කඩවත-කෙරවලපිටිය (අදියර 02-01) | 926 | 12 | 1.3 | 107.96 |
| | 3,180 | 1,199 | 37.7 | 2,336.73 |

(ආ) ව්‍යාපෘති කටයුතු හේතුවෙන් අවතැන්වූ පුද්ගලයින්ට විකල්ප ඉඩම් ලබාදීමට මහරගම,කඩුවෙල,බියගම, හා වත්තල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල පිහිටි හෙක්ටයාර 6.417 ක් ඉඩම් ව්‍යාපෘතිය විසින් රු.195,027,625 ක පිරිවැයකට අත්පත් කරගෙන තිබුණි.ඊට අමතරව එම ඉඩම් හිමිකරුවන් වෙත ගෙවිය යුතු මුදල නිරවුල් කිරීම ප්‍රමාද වීම මත පොලී වශයෙන් රු.30,688,686 ක මුදලක් ද ගෙවා තිබුණි. එම ඉඩම් වලින් අවතැන් වූ

පුද්ගලයින් අතර අතර බෙදා දීමට ඉඩම් කොටස් 126 ක් සලකුණු කර තිබුණු නමුත් 2010 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 28 ක් පමණක් බෙදා දී තිබුණි. ඒ අතුරින් ඉඩම් කොටස් හතක පමණක් නීතිමය අයිතිය පදිංචි කරුවන් වෙත මාරු කර තිබුණි.

උක්ත කරුණට අමතරව, සමාලෝචිත වර්ෂය තුලදී සිදුකර තිබුණු ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(1) 2010 පෙබරවාරි 16 දිනට බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුපිල පිහිටි ඉඩමේ සලකුණු කිරීමේ කටයුතු සම්පූර්ණ කර තිබුණු නමුත්, ව්‍යාපෘති කාර්යාලය වෙත තොරතුරු ලබාදීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2010 නොවැම්බර් 30 වන දින තුරුත් ඉඩම් සලකුණු කිරීමේ විස්තර ව්‍යාපෘති කාර්යාලයෙන් ලබා ගත නොහැකි විය. පරීක්ෂණ දිනය වන විට අංක 3 දරණ ඉඩම් කොටස වෙන් නොකර පැවතුණු බව විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද, අඩි 12 ක් පළල වූ ඉඩමේ ප්‍රවේශ මාර්ගය ආරම්භයේද අඩි 10 ක් දක්වා පටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(II) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩම කොටස් 23 කට සලකුණු කර තිබුණු අතර ඉඩම් කොටස් හතක් පමණක් අවතැන් වූ පුද්ගලයන් අතර බෙදා දී තිබුණි. තවද, ඉඩමට ඉහලින් දිවෙන අධි ධාරිතාවයෙන් යුත් විදුලි රැහැන් මාර්ගය හේතුවෙන් පර්චස් 10 ක ප්‍රමාණයේ ඉඩම් කොටසක් නිශ්කාර්යව පැවතුණි. පර්චස් තුනක ප්‍රමාණයෙන් යුත් වෙනත් ඉඩම් කොටසක් එහි ත්‍රිකෝණාකාර පිහිටීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. 2010 දෙසැම්බර් 31 දින වන විටත් අනෙකුත් ඉඩම් කොටසක් බෙදාදීමට සුදුසු පුද්ගලයින් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.2.3 නැවත පදිංචි කිරීමේ කටයුතු

-------------------------------

ව්‍යාපෘති කටයතු හේතුවෙන් අවතැන් වන පුද්ගලයින් නැවත පදිංචි කිරීමේ කටයුතු 2007 වර්ෂයේදී සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර නොතිබුණු අතර ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ඉඩම් අත්පත් කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා 2008,2009 හා 2010 වර්ෂවල අමතර කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව නැවත පදිංචි කිරීම කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් හෙක්ටයාර 6.417 ක් අත්පත් කරගෙන තිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට එම කටයුතු වල ප්‍රගතිය පහත දැක්වේ.

| | නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා අත්පත් කරගත් ඉඩම් කොටස් ගණන | 2010 දෙසැම්බර් 31 දිනට බෙදාදුන් ඉඩම් කොටස් ගණන | නැවත පදිංචි කිරීමේ කටයුතුවල ප්‍රගතිය % |
|---|---|---|---|
| කොට්ටාව - කඩුවෙල (අදියර 01) | 30 | 16 | 53 |
| කඩුවෙල - කඩවත (අදියර 02) | 39 | 12 | 51 |
| කඩවත - කෙරවලපිටිය (අදියර 02-01) | 57 | නැත | - |
| | ------ 126 ==== | ------ 28 === | 24 |

## 4.3 අරමුණින් බැහැර වූ විෂයයන්

ව්‍යාපෘතියේ කාර්යයන්ට සම්බන්ධ නොවූ වීඩියෝ චිත්‍රපටයක් නිපදවීම සඳහා වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ඉල්ලීම මත ව්‍යාපෘතිය විසින් රු.1,190,250 ක මුදලක් වැයකර තිබුණි. 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක:පීඊඩී/12 හි 8.3.9 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතිය එහි සම්පත් කිසිදු වෙනත් ආයතනයක් විසින් සිදුකරන කටයුතු සඳහා යෙදවීමට අවසර නොදිය යුතුය.